ලංකාණ්ඩුවේ "ගැසැට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,513—1946ක්වූ පෙබරවාරි මස 1 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කාර්යයක්තකට, ඒ නම්:—කිරිදිවැල අමුණ බැඳීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැණීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කාරනිබන්ධන සංශෝධනවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් සැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

පිහියමේ නො. A 1,821. ගම—උඩගම.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකමකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | වලලියද්දකුඹුර | .. | කුඹුර .. .. .. | ඉලන්දුරිපේඩිගේ පොඩි උක්කුවා, එම ලොකු උක්කුව, එම අබින්දි, එම පොඩිගා, එම ජෝන සහ මුතුකලආරච්චිගේ ඥදුන් ගනෝනිස්, කිරිදිවැල | 0 | 0 | 5·3 |
| 2 | දෙල්ගහවත්ත | .. | අවුරුදු 50 කොස්ගහක්ද, අවුරුදු 30 දෙල් ගහක්ද, අවුරුදු 20 පොල්ගස් 3ක්ද, අවුරුදු 10 පුවක්ගස් 2ක්ද ඇති පොල් ඉඩම | වරුසමානපේඩිගේ පොඩින ඉවදු උඩුගම, කිරිදිවැල | 0 | 0 | 14·8 |
| 3 | ඇලබොඩවත්ත | .. | අවුරුදු 30 පොල්ගස් 11ක්ද, අවුරුදු 5 පොල් ගහක්ද, අවුරුදු 10 කොස්ගස් 2ක්ද, අවුරුදු 2–10 රඹුටන්ගස් 2ක්ද, අවුරුදු 1–20 පුවක් ගස් 15ක්ද, අවුරුදු 5 දෙහිගහක්ද, අවුරුදු 8 ලුනුමිදෙල්ලගස් 4ක්ද, අවුරුදු 4 ලුනු මිදෙල්ලගහක්ද, අවුරුදු 5 කොබපරගහක්ද, ලිඳක්ද ඇති පොල් ඉඩම | ඉලන්දුරිපේඩිගේ පොඩිඋක්කුව, කිරිදිවැල | 0 | 0 | 16·8 |
| 4 | එම | .. | අවුරුදු 30 පොල්ගස් 2ක්ද, අවුරුදු 1 අඹ ගහක්ද, අවුරුදු 3 කොස්ගහක්ද, අවුරුදු 1 හල්ගහක්ද ඇති පොල් ඉඩම | යෝදපේඩිගේ සන්දුමලී, කිරිදිවැල | 0 | 0 | 3·4 |
| 6 | ගොරකගහවත්ත | .. | අවුරුදු 6–35 පොල්ගස් 14ක්ද, අවුරුදු 2–35 පුවක්ගස් 15ක්ද, අවුරුදු 3–15 කජුගස් 2ක්ද, අවුරුදු 25 වල්දෙල්ගහක්ද, අවුරුදු 10 දෙහිගහක්ද, අවුරුදු 3–10 නැඳුන්ගස් 3ක්ද, උණපඳුරු 2ක්ද, කොහිල කොටුවක් සහ ලිඳක්ද ඇති ඉඩම | රජකරුණාඅප්පුහාමිලාගේ දෙන් පිරිස් සහ කබලපොරගෙ දනියෙල් අප්පුහාමි, උඩගම, කිරිදිවැල | 0 | 0 | 17·9 |
| 7 | එම | .. | අවුරුදු 5–25 පොල්ගස් 6ක්ද, අවුරුදු 3–25 පුවක්ගස් 7ක්ද, අවුරුදු 25 නැඳුන්ගහක්ද, අවුරුදු 3 කොස්පැලයක්ද, අවුරුදු 5 ගොරක ගස් 2ක්ද, අවුරුදු 3 සපුපැලයක්ද, අවුරුදු 3 වෙරළුපැලයක්ද, උණපඳුරක්ද ඇති ඉඩම | වරුසමානපේඩිගේ සන්තිය, එම මනන්චි, එම නොලේනිය සහ එම පනීය, උඩගම, කිරිදිවැල | 0 | 0 | 4·9 |
| 8 | මීගහවත්ත | .. | අවුරුදු 25 පොල්ගහක්ද, අවුරුදු 3–25 පුවක් ගස් 11ක්ද, අවුරුදු 25 අඹගහක්ද, අවුරුදු 15 කිතුල්ගහක්ද සහ ලුනුමිදෙල්ලගහක්ද, අවුරුදු 10 ජම්බෝලගහක්ද ඇති ඉඩම | වරුසමානපේඩිගේ මැණිකා, උඩගම, කිරිදිවැල | 0 | 0 | 4·5 |
| 9 | එම | .. | අවුරුදු 15–40 පොල්ගස් 3ක්ද, අවුරුදු 3–20 පුවක්ගස් 34ක්ද, අවුරුදු 10–29 හල්ගස් 12ක්ද, අවුරුදු 25 දවටගහක්ද, අවුරුදු 10–20 ගුඹගස් 3ක්ද, අවුරුදු 15 ලුනුමිදෙල්ල ගහක්ද, අවුරුදු 10 සපුගහක්ද, අවුරුදු 20 ඉඹුල්ගහක්ද, අවුරුදු 15 කොබපරගහක්ද, අවුරුදු 10 ගඩුගුඩාගහක්ද, අවුරුදු 10 වල්දෙල්ගස් 4ක්ද, අවුරුදු 10කුරුඳුගහක් සහ කොන්නගහක්ද, උණපුරු 3ක් සහ කොසෙල්පඳුරු 4ක්ද, ලිඳක්ද ඇති ඉඩම | වරුසමානපේඩිගේ මල්ලුව, උඩගම, කිරිදිවැල | 0 | 0 | 25·6 |
| 10 | එම | .. | අවුරුදු 40 පොල්ගහක්ද, අවුරුදු 10 හල් ගහක්ද ඇති ඉඩම | වරුසමානපේඩිගේ මැණිකා, උඩගම, කිරිදිවැල | 0 | 0 | 5·1 |
| 11 | අවකපෙල්ලියැද්ද | .. | කුඹුර (අත්හරිනලද) .. .. | ඉලන්දුරිපේඩිගේ සුමදා, එට පොඩිගා, වරුසමානපේඩිගේ මැණිකා, උඩගම, කිරිදිවැල | 0 | 0 | 21·7 |
| 12 | කහටගහවත්ත | .. | අවුරුදු 2–10 පොල්ගස් 8ක්ද, අවුරුදු 1–20 පුවක්ගස් 14ක්ද, අවුරුදු 5–10 කිතුල්ගස් 2ක්ද, අවුරුදු 30 වල්දෙල්ගස් 2ක්ද, අවුරුදු 20 හල්ගස් 3ක්ද, අවුරුදු 30 බටදඹ ගහක්ද, අවුරුදු 20 ගොරකගස් 3ක්ද, අවුරුදු 5 දවටගහක්ද, අවුරුදු 30 කොස් ගහක්ද, අවුරුදු 5 කජුගහක්ද, අවුරුදු 10 නාරන්ගස් 2ක්ද, අවුරුදු 15 කැටකැල ගහක්ද, කොසෙල්පඳුරු 2ක්ද, උණපඳුරක්ද ඇති ඉඩම | ඉලන්දුරිපේඩිගේ සුමදා, උඩගම, කිරිදිවැල | 0 | 0 | 15·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 22වෙනි දින පෙරවරු 11ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ඇල්. බී. පර්ඩිනන්ඩ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්ම.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කිතුල්වල ගොවි ජනපදයට යාම ඒමට පාරක් සෑදීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,929. ගම—කිතුල්වල ඉහලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙල්ගහලන්ද .. | අවුරුදු 1 පොල්පැලයක් සහ අවුරුදු 3–10 පොල්ගස් 8ක්ද ඇති පොල් ඉඩම | පේල් ඒ. පීරිස් ලමාතැනි, පස්යාල | .. 0 0 23 |
| 2 | මුද්දරම්බ .. | කුඹුර සහ පොල් ඉඩම (වැටිලි නැත) | මාරසිංහපේඩිගේ බබා, එම මැනික, එම සුමිය, එම සාලය, එම කුසය, එම දනිය, එම චාර, එම හිල්මලී, එම සින්දී සහ එම බබී, කිතුල්වල, ඉහලගම | 0 0 4·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ඇල්. බී. පර්ඩිනන්ඩ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්ම.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මුගුරුගම්පොල ළිඳක් බැඳීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,944. ගම—හකුරුකුඹුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මඩුගහලන්ද .. | අවුරුදු 6 පොල්ගහක් සහ ළිඳක්ද ඇති පොල්ඉඩම | හේවාපේඩිගේ බන්ඩිය, එම හොවි, එම මලිඳුව, මුගුරුගම්පොල, මීරිගම; හේවාපේඩිගේ හොයියා, පොහොණ්නරුව, මීරිගම, අමරසිංහපේඩිගේ අල්ලියා, මුගුරුගම්පොල, මීරිගම, ජවරන්පේඩිගේ පිනා, මීරිගම, රාජපක්ෂපේඩිගේ බබී, රදාවදුන්න, පස්යාල | 0 0 2·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 11ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ඇල්. බී. පර්ඩිනන්ඩ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්ම.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මහනුවර දිස්ත්‍රික්කේ හැටවල යන ගමේ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,079. ගම—හැටවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුපුලේහේන .. | බැදපු අත්තිවාරමක් හා අඩිපාරක කොටසක් සහිත වත්ත | ඒ. බී. ආර්. ඒ. සමරනායක, හැටවල | .. 0 2 7·5 |
| 2 | එම .. | ස්ථිර ගොඩනැගිලි දෙකක් සහිත වත්ත | ජයසුන්දරමුදියන්සේලාගේ පුංචිබන්ඩා, හැටවල | 0 3 8·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 10ගේ කාලයට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ම ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 22වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇස්. කොහොඹන්-වික්‍රම,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්ම.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කෑගල්ලේ මුස්ලිම් ජාතිකයන්ට සොහොන්බිමක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,103. ගම—කෑගල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හලගිරියාවෙවත්ත .. | කොකෝ ඉඩම .. | වී. මුත්තුසාමි, කෑගල්ල | .. 0 2 1·2 |
| 2 | එම .. | එම .. | එම .. | .. 0 0 2·8 |

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 3 | හලගිවියාවේවත්ත | .. | බෑඳපු කානුවක් හා කොයෝ ඉඩම් කොටසක් සහිත මුඩුබිම | ඕ. කම්ජ බීබී මහත්මිය හා ඇස්. කේ. පික් මහම්ද්, කොංගල්ල | 0 0 0·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාවී තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 11ගේ කාහිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 22වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇස්. කොහොබන්-වික්‍රම,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

---

ආණ්ඩුවේ කවයුත්තකට, ඒනම්:—ගම් විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගේ බලයපිට පලාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,105. ගම—පොල්ගොල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලිඹන්ම් නොහොත් ලිඹන්ම් මතත නොහොත් හොහොත් පොලපිටියේහේන | උළු සෙවිලිකළ බෑදපු බංගලාවක්ද, ගබඩාවක්ද, වැසිකිලියක්ද, තකරම් සෙවිලිකළ බෑදපු ගරාජ් එකක්ද, පොල්අතු සෙවිලිකළ මඩුවක්ද, බෑදපු ළිඳක් හා වතුපාරක කොටසක් සහිත වත්ත | එල්. එම්. ඩී. ද සිල්වා; නො. 14, ෆේපංලි පාර, හැව්ලොක් වට්ටම; කොළඹ | 4 1 23·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1946ක්වූ පෙබරවාරි මස 28වෙනි දින පෙරවරු 10යේ කාහිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 25වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඒ. ඞී. ඩයිසන්,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කවයුත්තකට, ඒනම්:—ගම් විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීමේ සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩු කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 977. ගම—උරල.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | ගල්කැටියාගොඩ | .. | දෙනිය .. .. | ව්. අමරසූරිය මහත්මයා, මොරටුව | .. 0 0 9 |
| 2 | එම | .. | කොසෙල්ගස්, ආහාර ද්‍රව්‍ය වගාකරනලද තාවකාලික ගෙයකින් යුත් හේන | එම .. | .. 1 1 17 |
| 3 | එම | .. | හේන .. .. | එම .. | .. 0 0 33 |
| 4 | එම | .. | කුඹුර .. .. | එම .. | .. 1 1 38 |
| 5 | එම | .. | එම .. .. | එම .. | .. 0 0 18 |
| 6 | ගල්කැටියාගොඩ, මීහුවින් විල | | එම .. .. | එම .. | .. 0 0 39 |
| 7 | එම | .. | එම .. .. | එම .. | .. 0 0 2[illegible] |
| 8 | ගල්කැටියාගොඩ | | කැලෑව සහ හේන .. .. | එම .. | .. 88 1 8 |
| 9 | එම | .. | වයස අවුරුදු 15–20 පමණැති රබර් ඉඩම | එම .. | .. 16 1 0 |
| 10 | එම | .. | වයස අවුරුදු 15–20 පමණැති තේ ඉඩම | එම .. | .. 0 1 26 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1946ක්වූ මාර්තු මස 1වෙනි දින පෙරවරු 10යේ කාහිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාපින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 22වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

සී. ව්. පෙරේරා,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කවයුත්තකට ඒනම්:—හෙම්මාතගම පිහිටි ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ සෞඛ්‍ය නිවාසයට සහ අගල් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 488. ගම—ගිනිහප්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බොධිකොට්ටුවේහේන | පැලපොල් 1 සහ අවුරුදු 2–3 නාරන්පැල 2ක් තිබෙන ඉඩම | අදිකාරිමුදියන්සේලාගේ ගුණතිලක, හෙම්මාතගම | 0 0 30·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින උදේ දහයේ (10) කාහිසමට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 23වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඒ. කේ. ජේ. හෙන්ඩර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

(ආ) එක බුසලකට කූපන් 8 බැගින් ගොවිතැන් නොකරණ කුඹුරු හිමියන් විසින්ද (අම්බර හෝ හිලව් කූපන් භාරනොදිය යුතුයි.) නියමිත පරිදි කෑම ප්‍රණීය වී වෙන්කල වහාම පළාතේ ගම් මූලාදෑනියා වෙත නිසි කූපන් භාරදිය යුතුයි.

7. ඉහතකී නියෝගය කඩකරණ අයවළුන්හට විරුඩව නීති මාර්ගයෙන් ක්‍රියාකරණ බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ජී. පී. තම්බයියා,
හදිසි කටයුතු භාර උප ඒජන්තතැන,
වාරියපොල කොට්ඨාශය.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 22වෙනි දින
කුරුණෑගල (ක.) කච්චේරියේදීය.

---

### අභ්‍යන්තර වී මිලට ගැනීමේ ක්‍රමය.

### 1945–46 වර්ෂය පිළිබඳ මාස් කන්න.

කෑගල්ල දිස්ත්‍රික්කයේ උප දිසාපතිතැන්පත් ඒ. කේ. ජේ. හෙන්ඩර්සන් වන මා විසින්, අංක 37 දරන ආරක්ෂක (මිශ්‍ර) අණපනතින්ද, ආහාර මිලයට ගැනීමේ ආරක්ෂක අණපනත් වලින්ද, වර්ෂ 1943කේ ගොවිතැන්කිරීමේ ආරක්ෂක අණපනත් වලින්ද මා වෙත පවරා තිබෙන බලය පිට මින් නියෝගකරනු ලබන්නේ—

(1) වර්ෂ 1945–46 මාස් කන්නේ ගොයම් කපා පෑගීමට බලාපොරොත්තුවන කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි සෑම කුඹුරුවල අයිතිකරුවන් හෝ කුඹුරු ගොවිතැන්කරන්නවුන් විසින් ඒ බව ගොයම් කැපීමට දවස් දහයක් කල්තබා ලියවිල්ලකින් පහත දක්වන කරුනු ඇතුලත්කොට ස්වකීය ගම් මූලාදෑනිතැන වෙත හෝ වෙල් මූලාදෑනිතැන වෙත දැන්විය යුතුයි:—

(අ) ගොයම් කැපීමට හා පෑගීමට අදහස්කරන දිනයත්,
(ආ) කුඹුරේ නම, පිහිටීම හා ප්‍රමාණය,
(ඉ) කොන්ත්‍රාත්තුවක් පිට, පොරොන්දු පත්‍රයක් පිට හෝ අන්කිසි ආකාරයකින් කුඹුරේ අස්වැන්නට උරුමයක් ඇති කොටස්කරුවන්ගේ නම් හා ලිපිනම් ලැබෙන පිළිවෙළද,
(ඊ) එවැනි උරුමක්කාරයාට හෝ උරුමක්කාරයන්ට අස්වැන්නෙන් ලැබියයුතු කොටස් සම්බන්ධ විස්තර.



(2) ස්වකීය කුඹුරුවලින් ලබාගත් වී කමතෙන් ගෙනයා හැක්කේ කුඹුරු පිහිටි ප්‍රදේශයේ ගම් මූලාදෑනිතැන හෝ වෙල් මූලාදෑනිතැන විසින් පරීක්ෂාකොට මැන බැලීමෙන් පසුව අක්කර බද්ද වශයෙන් කුඹුරු අක්කරයකට වී බුසල් 2 බැගින් ගෙවා පහත සඳහන් පිළිවෙලට බලකඩදාසියක් ලබාගෙනය:—

(අ) එකම ගම් මූලාදෑනියෙකුගේ කොට්ඨාශය තුල වී ගෙන යෑමට—

කුඹුරු පිහිටි ප්‍රදේශයේ ගම් මූලාදෑනිතැන හෝ වෙල් මූලාදෑනිතැනගෙන් ඉල්ලුම් කළවිට ඕ. ඈෆ්. ඈස්. සහ සී 12 පෝරමයක බලකඩදාසියක් දෙනු ලැබේ.

(ආ) එකම ප්‍රධාන මූලාදෑනියෙකුගේ කොට්ඨාශය තුල නමුත් එක ගම් මූලාදෑනියෙකුගේ කොට්ඨාශයේ සිට තවත් ගම් මූලාදෑනියෙකුගේ කොට්ඨාශයට වී ගෙනයාමට (අ) කොටසේ සඳහන් බලකඩදාසියක් ගතයුතුයි. නමුත් එය එම පළාතේ ආදායම් පාලක නිලධාරීතැන හෝ රටේ මහතා ලවා අත්සන්කරවා ගතයුතුයි.

(ඉ) කෑගල්ල දිස්ත්‍රික්කය තුලම එක ප්‍රධාන මූලාදෑනියෙකුගේ ප්‍රදේශයෙන් පිට වී ගෙනයෑමට—

ඉල්ලුම්කරු පදිංචි පලාතේ ආදායම් පාලක නිලධාරීතැන හෝ රටේ මහතා වෙත ඕ. ඈෆ්. සී. 34 පෝරම් දෙකක් සම්පූර්ණකර ඉල්ලුම්කල යුතුයි. කුඹුරු පිහිටි කොට්ඨාසයේ ගම් මූලාදෑනිතැන හෝ වෙල් මූලාදෑනිතැනගේ රිපෝර්තු ඉල්ලුම්පත්‍රයට යාකල යුතුයි. ඕ. ඈෆ්. සී. 32 පෝරම් කොල ප්‍රධාන මූලාදෑනීන්ගේ කන්තෝරුවලින් හෝ මෙම කන්තෝරුවෙන් ලබාගත්ව පුළුවන.

(ඊ) කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පිට පලාත්වලට වී ගෙන යෑමට—

ඕ. ඈෆ්. සී. 34 දරන පෝරම් කොල දෙකක් සම්පූර්ණකර තමා පදිංචි පලාතේ උප ඒජන්තතුමාගෙන් ඉල්ලුම්කළ යුතුයි.

ඉල්ලුම්පත්‍රවලට කුඹුරු පිහිටි පලාතේ ගම් මූලාදෑනිතැනගේ හෝ වෙල් මූලාදෑනිතැනගේ රිපෝර්තු යාකළ යුතුයි.

(3) වී නිපදවන්නෙකුට ආහාර පිණිස ලග තබාගැනීමට ඉඩදියහැකි වැඩිම වී ප්‍රමාණය වන වී බුසල් 50 ඉක්මවානොයන පරිද්දෙන් ගොවිතැන්කරන්නවුන්හට හා නොවීතැන්කරන කුඹුරු හිමියන්ටද ඔවුන් ගෘහවාසීන්ටද සතියකට වී සේරු 6 බැගින්ද, ගොවිතැන් නොකරන කුඹුරු හිමියන්ටද ඔවුන් ගෘහවාසීන්ටද සතියකට වී සේරු 4 බැගින්ද ආහාර පිණිස වෙන්කරනුලබන්නේය. ඉතිරිව ඇති සියලුම වී තමාගේ කොට්ඨාශ භාර ගම් මුලාදැනිතැනට ඔහුගේ ගෙදරට හෝ වී ගබඩාවට ගෙනවුත් භාරදිය යුතුයි.

(4) ඉහත සඳහන් (3) කොටසේ දැක්වූ ක්‍රමය අනුව ආහාරට තබාගැනීමට ඉඩදෙනලද වී වෙනුවෙන් පහත පෙන්නුම්කරන ආකාරයට කූපන් ඉරාගනු ලැබේ.

එනම්—

වී ගොවිතැන්කරන්නවුන් හෝ ගොවිතැන්කරන කුඹුරු හිමියන් විසින් ලැබූ වී සේරු 6කටම එක (1) කූපන් පත්‍රය බැගින් හා කුඹුරු හිමි වී ගොවිතැන්නොකරන්නවුන් විසින් ලැබූ සෑම වී සේරු 4කටම 1 කූපන් පත්‍රය බැගින්ද වේ.

(5) ගොයම් පාගා සුමාන 6ක් ඇතුලත නියමිත පරිදි වී ගෙනයාම පිණිස ඉල්ලීමක් නොකරනලද නම් ඒ වී ප්‍රමාණයත් අභ්‍යන්තර වී මිලයට ගැනීමේ ක්‍රමය පටනේ තහනමට ගනු ලැබේ.

(6) වී ගෙනයාමට ඉල්ලුම්පත්‍ර ඉතා වේලාසනින් ඉල්ලුම්කරනු ලබන්නේ එකී සඳහන් කරුණුවල සත්‍යාසත්‍යතාවය සොයාබලා ශුභසුලුව බලපත්‍ර නිකුත්කිරීම සඳහාය.

(7) මේ කරනලද නියමයන් අනුව ක්‍රියානොකරන අයට නීතියෙන් දඬුවම් පමුණුවනුලබන බව ඉතා පරීක්ෂාවෙන් සිහියේ තබාගත යුතුයි.

ඒ. කේ. ජේ. හෙන්ඩර්සන්,
කෑගල්ලේ උප ඒජන්තතැන.

මේ 1946ක්වූ ජනවාරි මස 23වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

---

## ලංකා සේවිංස් බැන්කුවේ පොලී පිළිබඳ දැන්වීමයි.

සිලෝන් සේවිංස් බැන්කුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියෝගය යටතේ 1946 අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය සියයට $2\frac{1}{2}$ක් බව එම බැන්කුවේ ට්‍රස්ටීවරුන් විසින් දන්වා සිටිනු ලැබේ.

ලෙස්ලි. වී. කූපර්,
සෙක්‍රතාරිස්තැන.

මේ 1946ක්වූ ජනවාරි මස 12වෙනි දින
කොළඹ සිලෝන් සේවිංස් බැන්කුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.